කාව්‍යවායනව්‍යාකරණං

පෙරවදන

කච්චායන ව්‍යාකරණය

පාලි භාෂාව පිළිබඳ ව ප්‍රධාන ව්‍යාකරණ සම්ප්‍රදාය තුනක් ප්‍රචලිත ව ව්‍යවහාරයෙහි පැවති බව පෙනේ.

එනම් :- i. කච්චායන ව්‍යාකරණ සම්ප්‍රදාය
ii. මොග්ගල්ලායන ව්‍යාකරණ සම්ප්‍රදාය
iii. සද්දනීති ව්‍යාකරණ සම්ප්‍රදාය යනුවෙනි.

කච්චායන ව්‍යාකරණ සම්ප්‍රදාය :-

දැනට විද්‍යමාන පාලි ව්‍යාකරණ කෘති අතුරෙන් පැරණි ම ග්‍රන්ථය ලෙස සැලකෙන්නේ කච්චායන ව්‍යාකරණය යි. මෙය ශ්‍රී ලංකාවේ බෙහෙවින් ජනප්‍රිය වූ පාලි ව්‍යාකරණ සම්ප්‍රදායයේ මූලික ග්‍රන්ථය යි. මෙහි කතුවරයා "බුදුරදුන් ජීවමාන කාලයේ අවන්ති ජනපදයෙහි විසූ බුද්ධශ්‍රාවක මහාකච්චායන මහරහතන් වහන්සේ ය" යනු ථෙරවාදී සම්ප්‍රදායයෙහි පිළිගැනීම යි. මහාකච්චායන තෙරුන් වහන්සේ පූර්ව ප්‍රාර්ථනා වශයෙන් කච්චායනය ද, මහානිරුත්තිප්පකරණය ද, නෙත්තිප්පකරණය ද යනුවෙන් ප්‍රකරණ තුනක් ප්‍රකාශ කරණ ලදැ'යි අංගුත්තරනිකාය ටීකාවේ සඳහන් වන බව සුගුති නාහිමියෝ පවසති. එහි සූත්‍ර පමණක් මහාකච්චායන තෙරුන් විසින් රචනා කරණ ලද බවත්, 'සංඝනන්දි සහ බ්‍රහ්මදත්ත' යන භික්ෂූන් වහන්සේලා දෙනම විසින් කච්චායනයෙහි වෘත්ති හා උදාහරණ රචනා කරණ ලද බවත් බුද්ධදත්ත නාහිමියෝ පවසති.

කච්චානෙන කතො යොගො - වුත්ති ච සංඝනන්දිනා
පයොගො බ්‍රහ්මදත්තෙන - න්‍යාසො විමලබුද්ධිනා

මේ පිළිබඳ ව පර්යේෂණය කළ මහාචාර්ය මලලසේකර මහතා මෙසේ සඳහන් කර ඇත.

'අර්ථ විවරණය පිළිබඳ විභාගයක් වශයෙන් විශේෂ ධර්ම ව්‍යාඛ්‍යාන ග්‍රන්ථයක් වන නෙත්තිප්පකරණය බුදුරදුන් ධරමාන සමයෙහි ජීවත් වූ ශ්‍රේෂ්ඨතම විභජ්ජවාදී දේශකයාණන් වන මහාකච්චායන තිමියනට ම පැවරිය යුතු බව සැලකිය යුතු ය. අවන්ති ජනපදයෙහි විසූ ආචාර්ය පරම්පරාව තරමක් හුදකලාව වෙසෙමින් එකිනෙකට සම්බන්ධ

විෂයයන් දෙකක් වන ව්‍යාකරණය සහ විභාග කරණ ක්‍රමයක් ද දියුණු කරන්නට ඇත. එහෙයින් මෙම සංක්ෂිප්ත සූත්‍රවල කර්තෘත්වය මහාකච්චායන හිමියන්ට අයත් ලෙස පිළිගැනීම සාධාරණ වන්නේ එම විෂයය පරම්පරාගත ව ගෙන එමින් දියුණු කළ ආචාර්‍ය වාදයක ආරම්භකයා ලෙස ගණිනු ලබන තරමට ය. තවද, විනය නීති ප්‍රාමාණ්‍ය යුක්ත ප්‍රකාශ හැටියට දැක්වීමේ දී කියනු ලබන 'අනුජානාමි භික්ඛවෙ' යන වචන ශ්‍රී මුඛයට නංවන ලද්දාක් මෙන් ම ව්‍යාකරණ සූත්‍ර ද වෛයාකරණික පරම්පරාවේ ආදිකර්තෘනට ම පැවරීමෙන් එහි පිළිගත යුතු බව තහවුරු වනු ඇත.

'කච්චායන' යනු පුද්ගල නාමයක් ලෙස සැලකීම සුදුසු ය. බුද්ධශ්‍රාවක මහාකච්චායන තෙරුන් වහන්සේ ද එම පරපුරට අයත් වූ කෙනෙකි. එම කච්චායන පරම්පරාව ත්‍රිපිටකයට අර්ථ විවරණය කිරීමටත්, ව්‍යාකරණ විග්‍රහයටත් ප්‍රසිද්ධ ව සිටි බව පිළිගත හැකි ය. එම පරපුරට අයත් කච්චායන නමින් සිටි පසුකාලීන ආචාර්‍යවරයෙකු විසින් රචනා කරණ ලද ව්‍යාකරණ කෘතියක් එම කච්චායන ගෝත්‍ර නාමයෙන් ම ප්‍රසිද්ධ වන්නට ඇත. මේ පිළිබඳ ව තව දුරටත් කරුණු දක්වන මලලසේකර මහතා මෙසේ පවසයි.

"එම පරම්පරාව සතුව ව්‍යාකරණ රීති මාලාවක් තිබෙන්නට ඇතැ'යි නිගමනය කිරීම යුක්ති සහගත ය. ඒවා ඇතැම් විට අවන්ති ජනපදයේ කච්චායන ආචාර්‍ය පරම්පරාවට අයත් සංඝනන්දි, බ්‍රහ්මදත්ත සහ විමලබුද්ධි යන හිමිවරුන් විසින් ජම්බුද්වීපයේ දී දියුණු කරණ ලද බව පෙනී යයි. දැන් අප අතර විද්‍යමාන කච්චායන ව්‍යාකරණය සංඝනන්දි තෙරුන් විසින් විස්තෘත කොට පිළියෙල කරණ ලද පරම්පරානුගත ව 'මහාකච්චායන සුත්ත' යනුවෙන් හැඳින්වුණු ග්‍රන්ථයෙහි සංශෝධිත සංස්කරණයක් ලෙස සැලකිය හැකි ය" යනුවෙනි.

කච්චායන ව්‍යාකරණය බුද්ධකාලයේ විසූ මහාකච්චායන මහරහතන් වහන්සේ විසින් රචනා කරණ ලද්දක් යැ'යි පිළිගතහොත්, ක්‍රි. ව. 5 වන සියවසේ දී අට්ඨකථා කරණයේ දී බුදුගොස් හිමියන් විසින් එය අනුගමනය කරන්නට ඇතැ'යි නිසැකව ම කිව හැකි ය. එහෙත් විභක්ති සංඥා නාම දැක්වීමේ දී කච්චායන ව්‍යාකරණය පඨමා, දුතියා, තතියා, චතුත්ථී, පඤ්චමී, ඡට්ඨී, සත්තමී යනුවෙන් සතු වියරණය අනුගමනය කරමින් සංඛ්‍යාත්මක පදනමක් මත පිහිටා ඇති අතර, අඩුවා ඇදුරන් ඊට පෙර පටන් පැවත ආ පච්චත්තවචන, උපයොගවචන, කරණවචන, සම්පදානවචන, නිස්සක්කවචන, සාමිවචන, භුම්මවචන හා ආලපනවචන යනුවෙන් කාරකාර්ථය සලකා ඊට භාෂාසින් වෙනස්

වූ පාරිභාෂික සංඥා නාම භාවිත කොට තිබීමෙන් පැහැදිලි වන්නේ කච්චායන ව්‍යාකරණය අටුවා ලියැවුණු යුගයේ නො තිබුණු බව යි. මේ අනුව අටුවා ලියැවුණු යුගයේ කච්චායනයට වඩා වෙනස් වූ, පැරණි ස්වාධීන, එමෙන් ම පිළිගත් ව්‍යාකරණ සම්ප්‍රදයක් තිබුණු බව ප්‍රකට වේ. එම ව්‍යාකරණ සම්ප්‍රදය බුද්ධඝෝෂ, ධම්මපාල ආදි අර්ථකථාචාර්යවරුන්ට පෙර තිබූ "බෝධිසත්ව ව්‍යාකරණයට" අනුව සකස් වූවක් විය හැකි බව ජර්මන් ජාතික "ඔටෝ ප්‍රාන්ක" මහතා අදහස් කරයි. කච්චායන ආචාර්‍යවරයා බුද්ධකාලයෙහි සිටි මහාකච්චායන තෙරුන් හෝ ක්‍රි.පූ. 3 වන සියවසෙහි විසූ පාණිනී ව්‍යාකරණයට "කාත්‍යායන" නමැති වාර්තික පාඨ ලියූ කච්චායන තෙරුන් හෝ නො වන බව ගයිගර් මහතා පවසයි. ක්‍රි. ව. පළමු වන සියවසෙහි දී සර්ව වර්මන් නමැති පඬිවරයා විසින් ලියන ලද "කාතන්ත්‍රය" සහ ක්‍රි. ව. 7 වන සියවසෙහි විසූ ජයාදිත්‍ය සහ වාමන යන දෙදෙනා පාණිනීය ව්‍යාකරණයට ලියන ලද "කාශිකා වෘත්ති" නමින් හැඳින්වෙන විවරණය ද කච්චායනය ලිවීමේ දී ඇසුරු කොට ඇති නිසා මෙහි කතුවරයා විසූ කාලය නිසැකව ම 7 වන සියවස පමණ විය යුතු බව ගයිගර් මහතා වැඩිදුරටත් පවසයි. මහාචාර්‍ය පොල්වත්තේ බුද්ධදත්ත නාහිමියන්ගේ අදහස ද කච්චායන කතුවරයා පසු කලෙක විසූ හිමි නමක් විය හැකි බව යි.

කච්චායන ව්‍යාකරණයෙහි සඤ්ඤා කාණ්ඩයෙහි දැක්වෙන පරසමඤ්ඤා පයොගෙ' යන සූත්‍රයෙන් සංස්කෘත ව්‍යාකරණයෙහි එන පාරිභාෂික නම් සියල්ල ම පාලි ව්‍යාකරණයෙහි දී ද යොදා ගත යුතු බව උගන්වයි. ඒ අනුව අක්ඛර, අසොස, අජ්ජතනී, අත්තනොපද, අපාදාන, අබ්භාස, අව්‍යයීභාව, ආඛ්‍යාත, ආගම, ආදේශ, උත්තමපුරිස, උපසග්ග, කම්මධාරය, කාරක, කාරිත, කිච්ච, කිත, චුරාදිගණ, තද්ධිත, තප්පුරිස, නාම, ධාතු, ලිංග, විභත්ති, විභාග, වුද්ධි, පාටිපදික, බහුබ්බීහි, ඛ්‍යඤ්ජන, යොගවිභාග, සබ්බධාතුක, සබ්බනාම, සමාස, සම්පදාන, හීයත්තනී ආදි පාරිභාෂික නාම කච්චායනයෙහි දී යොදා ගෙන ඇත. මෙයින් ද කච්චායන ව්‍යාකරණයට සංස්කෘත ව්‍යාකරණ ග්‍රන්ථයන්ගෙන් ලැබී ඇති බලපෑම කෙබඳු දැ'යි පෙනේ. පාලි භාෂාවෙහි ව්‍යාකරණ කෘති සම්පාදනය කර තිබෙන්නේ සංස්කෘත ව්‍යාකරණ කෘති සම්පාදනය කිරීමෙන් පසු කලෙක නිසා පාලි ව්‍යාකරණඥයින් සංස්කෘත ව්‍යාකරණ ග්‍රන්ථ අනුගමනය කරන්නට ඇතැ'යි සිතීම යුක්ති යුක්ත ය.

තවද, ජේම්ස් අල්විස් මහතා පෙන්වා දෙන පරිදි පාණිනීය ව්‍යාකරණයට සමාන බොහෝ කච්චායන සූත්‍ර දක්නට ලැබේ. ඒවායින් කීපයක් පහත දැක්වේ.

පාණිනීය			කච්චායනය	
භූවාදයො ධාතවඃ	(1.3.1.)	-	භූවාදයො ධාතවො	(459)
යෙනාඞ්ගවිකාරඃ	(2.3.20.)	-	යෙනඞ්ගවිකාරො	(293)
චතුර්ථී සම්ප්‍රදානෙ	(2.3.13.)	-	සම්පදානෙ චතුත්ථී	(295)
අපාදානෙ පඤ්චමී	(2.3.28)	-	අපාදානෙ පඤ්චමී	(297)
කර්මණි ද්විතීයා	(2.3.2.)	-	කම්මනෙථ දුතියා	(299)
ද්විගුරෙකවචනං	(2.4.1.)	-	දිගුස්සෙකත්තං	(323)
ස නපුංසකම්	(2.4.17)	-	සො නපුංසකලිංගො	(322)
කාලාධ්වනොරත්‍යන්තසංයොගෙ	(2.3.5.)	-	කාලද්ධානමච්චන්තසංයොගෙ	(300)
කර්මප්‍රවචනීයයුක්තෙ ද්විතීයා	(2.3.8.)	-	කම්මප්පවචනීයයුත්තෙ	(301)

මෙම සූත්‍ර සමානත්වය අනුව පාණිනීය ව්‍යාකරණයේ ආධාරයෙන් කච්චායන ව්‍යාකරණය ලියා ඇති බව එතුමා පවසයි. තවද, 'ඉන්ද්‍රව්‍යාකරණය' ඇසුරෙන් සර්වවර්මන් විසින් ලියන ලද කාතන්ත්‍රයේ ඇතැම් සූත්‍ර හා සසඳා බලන විටඒවායේ බොහෝ සමානකම් දක්නට ලැබේ. ඒවායින් කීපයක් පහත දැක්වේ.

කාතන්ත්‍රය		කච්චායනය	
යත් ක්‍රියතෙ තත් කර්ම	(2.4.13.)	යං කරොති තං කම්මං	(282)
යඃ කරොති ස කර්තා	(2.4.14)	යො කරොති ස කත්තා	(283)
හෙත්වර්ථෙ ච	(2.4.30)	හෙත්වත්ථෙ ච	(291)
කර්තරි ච	(2.4.33)	කත්තරි ච	(290)
නාමානාං සමාසො යුක්තාර්ථඃ	(2.5.1.)	නාමානං සමාසො යුත්තත්ථො	(318)
කාරයති යඃ ස හෙතු	(2.4.15)	යො කාරෙති ස හෙතු	(284)
ස්වරො හ්‍රස්වො නපුංසකෙ	(2.4.15)	සරො රස්සො නපුංසකෙ	(344)
ප්‍රථමාවිභක්තිර්ලිංගාර්ථවචනෙ	(2.4.17)	ලිංගත්ථෙ පඨමා	(286)
යතොපෙති භයමාදත්තෙ වා තදපාදානං	(2.4.40)	යස්මාදපෙති භයමාදත්තෙ වා තදපාදානං	(273)
යස්මෛ දීත්සා රොචතෙ ධාරයතෙ වා තත් සම්ප්‍රදානම්	(2.4.36)	යස්ස දාතුකාමො රොචතෙ ධාරයතෙ වා තං සම්පදානං	(278)
ය ආධාරස්තදධිකරණම්	(2.4.11)	යොධාරො තමොකාසං	(289)
යෙන ක්‍රියතෙ තත් කරණම්	(2.4.12)	යෙන වා කයිරතෙ තං කරණං	(281)
පදෙ තුල්‍යාධිකරණෙ විශෙෂ්‍යඃ කර්මධාරයඃ	(2.5.6)	ද්විපදෙ තුල්‍යාධිකරණෙ කම්මධාරයො	(326)
වාණපත්‍යෙ	(2.6.1.)	වාණප්පච්චෙ	(346)

වගේ වගීන්තඃ	(2,4,45)	වග්ගන්තං වා වග්ගෙ	(31)
ද්වන්දස්ථාච්ච	(2.1.32.)	ද්වන්දව්ඨා වා	(165)
බහුව්‍රීහෞ	(2.1.35.)	බහුබ්බිහිම්හි ච	(167)
නාඤ්ඤත් සර්නාමිකං	(2.1.33.)	නාඤ්ඤං සබ්බනාමිකං	(166)
තස්මාත් පරා විභක්තයඃ	(2.1.2.)	තතො ච විභත්තියො	(54)

මෙම සූත්‍ර සමානත්වය කච්චායනයෙහි මුල සිට අග තෙක් දක්නට ලැබේ. ඒ අනුව පැහැදිලි වන්නේ කච්චායන ව්‍යාකරණය ලියා ඇත්තේ පාණිනීය සහ කාතන්ත්‍රය යන ව්‍යාකරණ ග්‍රන්ථ දෙක ම ආශ්‍රය කිරීමෙන් බව යි. එහෙත් බොහෝ විද්වතුන්ගේ පිළිගැණීම නම් පාණිනීයටත් වඩා කාතන්ත්‍රයේ බලපෑම කච්චායනයට ලැබී ඇති බව යි. විශේෂයෙන් ම ප්‍රාතිශාඛ්‍යයන්හි දැක්වෙන ක්‍රමය හා සමානත්වයක් දක්නට ලැබෙන සංඥා ක්‍රමයක් ඇති සර්ව වර්මන් විසින් කරණ ලද කාතන්ත්‍රය කච්චායනයට පමණක් නොව ද්‍රවිඩ හා ටිබට් ව්‍යාකරණයන්ටත් ගුරු පොත වූ බව ආතර් ඒ. මැක්ඩොනල්ඩ් මහතා පවසයි. මේ අනුව කච්චායනය රචනා වන්නට ඇත්තේ අවුවා ද සම්පාදනය කිරීමෙන් පසුව බව නිගමනය කළ හැකි ය.

කච්චායනයෙහි භාවිත කොට ඇති සියලු ම සූත්‍ර වගී සයකට බෙදිය හැකි ය.

එනම් : සඤ්ඤා ච පරිභාසා ච - විධිං නියමමෙව ච
අතිදෙසාධිකාරො ච - ජබ්බිධං සුත්තලක්ඛණං

1. සංඥා සූත්‍ර 2. පරිභාෂා සූත්‍ර
3. විධි සූත්‍ර 4. නියම සූත්‍ර
5. අතිදේශ 6. අධිකාර සූත්‍ර යනුවෙනි.

1. සංඥා සූත්‍ර :-

සංඥා කාණ්ඩයෙහි දැක්වෙන එක් සූත්‍රයක් හැර සෙසු සූත්‍ර සියල්ල සංඥා සූත්‍ර ලෙස හැඳින්විය හැකි ය. තතෝදන්තා සරා අට්ඨ යනු ස්වර සංඥා සූත්‍රය කි. ඔකාරය අන්ත කොට ඇති අකුරු අට ස්වර නම් වේ යනු එහි අදහස යි. අං ඉති නිග්ගහීතං යන සූත්‍රයෙන් අකාරයෙන් පරව ඇති බින්දුව නිග්ගහීතය ලෙස හඳුන්වා ඇති බැවින් එය ද සංඥා සූත්‍රයකි. ආඤ්ඤෙ දීඝා, සෙසා ඛ්‍යඤ්ජනා ආදි සූත්‍රවලින් ද දීඝ, ඛ්‍යඤ්ජන යන සංඥා දක්වා ඇති බැවින් ඒවා සංඥා සූත්‍ර ලෙස දැක්විය හැකි ය.

2. පරිභාෂා සූත්‍ර :-

"පරිතො ව්‍යාප්තා භාෂා පරිභාෂා" එක තැනක සිට සියලු ශාස්ත්‍ර බබුළුවන හෙයින් පරිභාෂා නමින් එම සූත්‍ර හැඳින්වේ. "පරසමඤ්ඤා පයොගෙ" යන සූත්‍රයෙන් සංස්කෘත ව්‍යාකරණයෙහි ඉගැන්වෙන සියලු ම සංඥා පාලි ව්‍යාකරණයෙහි දී ද ප්‍රයෝගයක් ඇති කල්හි භාවිත කළ යුතු බව උගන්වා ඇත. එය මුළු ව්‍යාකරණ ශාස්ත්‍රය ම බබුළුවන ආලෝකයක් වැනි ය. එ බැවින් එය පරිභාෂා සූත්‍රයක් ලෙස හැඳින්විය හැකි ය. එසේ ම සන්ධි වන පද දෙකින් මුල් පදයේ අග ස්වරය ලොප් කළ යුතු බව දැක්වෙන "පුබ්බමඤ්ඤොඨිතමස්සරං සරෙන වියොජයෙ" යන සූත්‍රය ද, හල් අකුරත් ස්වරයත් එකතු කළ යුතු යැ'යි දැක්වෙන "තයෙ පරං යුත්තෙ" යන සූත්‍රය ද මුලු භාෂාවේ ඇති සියලු ම සන්ධි කාර්‍යයන්හි දී උපයෝගී වන හෙයින් පරිභාෂා සූත්‍ර සංඛ්‍යාවට ම ගැනේ. එම පරිභාෂා සූත්‍ර මුලින් දැක්වීමෙහි ප්‍රයෝජනය නම් නැවත නැවතත් එය දැක්වීමට අවශ්‍ය නො වීම යි. එම සූත්‍ර මුලින් නො දැක්වූයේ නම් ඒ ඒ තැන්වල යළි දැක්වීමෙන් ග්‍රන්ථය අති විශාල වේ. ග්‍රන්ථ බාහුල්‍ය භීතියෙන් එම සූත්‍ර ආරම්භයේ දී ම දක්වා ඇත. ධාතු හා ලිංග කෙරෙන් පරව ප්‍රත්‍යයන් යෙදිය යුතු යැ'යි ඉගැන්වෙන "ධාතුප්පච්චයෙහි පරා විභත්තියො" යන සූත්‍රය ද, නාම කාණ්ඩයත් ආඛ්‍යාත කාණ්ඩයත් පුරා ම ආලෝකය විහිදුවන සූත්‍රයකි. බැවින් එය ද පරිභාෂා සූත්‍රයක් ලෙස නම් කළ හැකි ය. කච්චායනයෙහි සූත්‍රවලින් උගන්වා නැති යම් පදයක් වේ නම් එහි නිෂ්පත්තිය නිපාතන විධියෙන් සිදු කළ යුතු යැ'යි ඉගැන්වෙන "යදනුප්පන්නා නිපාතනා සිජ්ඣන්ති" යන්න මුළු පාලි ව්‍යාකරණයට ම ආලෝකය විහිදුවන ඉතා වැදගත් පරිභාෂා සූත්‍රයකි.

3. විධි සූත්‍ර :-

සන්ධි කාර්‍යයෙහි දී අතිශයින් උපයෝගී වන ලෝප ආදේශ ආගම හ්‍රස්ව දීඝ ද්විත්ව ආදි විධානයන් කෙරෙන සූත්‍ර සියල්ල ම විධි සූත්‍ර ලෙස සැලකේ. සරා සරෙ ලොපං යනු ස්වරයක් පර කල්හි පූර්ව ස්වරය ලොප් වන බව දැක්වෙන සූත්‍රයක් බැවින් එය ලෝප විධි සූත්‍රයකි. "ක්වවාසවණ්ණං ලුත්තෙ" යනු අසවර්ණාදේශ විධි සූත්‍රයකි. යවමදනතරළා වාගමා යනු ආගම විධි සූත්‍රයක් වන අතර දීඝං යනු දීර්ඝ විධි සූත්‍රයකි. මෙසේ නාම ආඛ්‍යාත පද සෑදීමේ දී කෙරෙන විවිධ ආදේශ දැක්වෙන සූත්‍ර "විධි සූත්‍ර"ලෙස නම් කළ හැකි ය.

4. නියම සූත්‍ර :-

ඒ ඒ විභක්තීන්ට අයත් ප්‍රත්‍යයන් කවරේ දැයි නියම වශයෙන් දැක්වෙන සි යො අං යො නා හි ස නං ස්මා හි සනං ස්මිං සු යන සූත්‍රය නියම සූත්‍රයකි. එහෙත් රූපසිද්ධිය රචනා කළ චොළිය බුද්ධප්පිය හිමියන්ගේ මතය නම් එම සූත්‍රය "තතො ච විභත්තියො" යන සූත්‍රයට ම සම්බන්ධ කොටසක් බැවින් විභක්ති සංඥා සූත්‍රයක් බව යි. ආඛ්‍යාත කාණ්ඩයෙහි ඇති "ති අන්ති සි ථ මි ම" ආදි සූත්‍රවලින් ද ඒ ඒ ආඛ්‍යාතවලට අයත් ප්‍රත්‍යයන් නියම කරණ බැවින් ඒවා නියම සූත්‍ර ලෙස සැලකිය යුතු ය.

5. අතිදේශ සූත්‍ර :-

මෙයට අයත් වන්නේ කියන ලද කරුණුවලට අතිරේක වශයෙන් දැක්වූ සූත්‍ර යි. "අනුපදිට්ඨානං වුත්තයොගතො" යන සූත්‍රයෙන් දක්වා ඇත්තේ ස්වර, නිග්ගහීත, ව්‍යඤ්ජන යන සන්ධි කාර්‍යවල දී නො දක්වන ලද පදවල සන්ධිකාර්‍යයන් කියන ලද සූත්‍රානුසාරයෙන් ම දැන ගත යුතු බව යි. ඒ අනුව භාෂාවේ විද්‍යමාන විවිධ ආදේශ, විපර්‍යාස සිදු වී ඇති පද සිදු කළ හැකි ය. "අම්හතුම්හබ්‍රහ්මත්තසඛසත්ථුපිතාදිහි ස්මා නාව" යන සූත්‍රයෙන් දක්වා ඇති පරිදි අම්හ, තුම්හ, න්තුභාග,බ්‍රහ්ම, අත්ත, සත්ථු, පිතු ආදි ශබ්දවලින් පර වූ ස්මා විභක්තිය නා විභක්තිය මෙන් සැලකිය යුතු බවය. "තද්ධිතසමාසකිතකා නාමං. ච තවෙතුනාදිසු ච" යන සූත්‍රය ද අතිදේශ සූත්‍රයකි.

6. අධිකාර සූත්‍ර :-

එක් සූත්‍රයක කොටසක් හෝ මුළු සූත්‍රය ම හෝ අනික් සූත්‍ර හා සම්බන්ධ කිරීම සඳහා රඳ පවත්නේ අධිකාර සූත්‍ර වෙත ය. එ බැවින් සෙසු සියලු සූත්‍ර මෙයට යටත් වේ. අධිකාර සූත්‍රවල ස්වභාවය ත්‍රිවිධාකාර වේ.

i. සීහගතික අධිකාරය :-

සිංහයකු මෙන් ඉදිරිපස හා පිටුපස බැලීමේ ස්වභාවය ඇති සූත්‍ර මේ ගණයට අයත් වේ. ජ්තවචනයුත්තං හි යනු අධිකාර සූත්‍රයකි. මුලු පාලි ව්‍යාකරණ ශාස්ත්‍රය ම බුද්ධ වචනයට අනුකූල වන පරිදි සකස් වීය යුතු ය. පාලි භාෂාවේ අධිකාරය රඳ පවත්නේ බුද්ධවචනය පදනම් කරා ගෙණ ය. ත්‍රිපිටක බුද්ධවචනයට පටහැනි ව කිසිම පාලි වචනයක් සිද්ධ කළ නො හැකිය. එ බැවින් බුද්ධවචනයට බලය පැවරේ. මෙම සූත්‍රය සඳහන් වන්නේ නාම කාණ්ඩය ආරම්භයෙහි ය. එය බලපවත්වන්නේ ඉදිරි නාම කාණ්ඩයට පමණක් නොව පිටුපසින් ඇති සන්ධි කාණ්ඩයටත් සමග ය. එ බැවින් එය සිංහයකුගේ ගතිය ඇති සූත්‍රයක්

ලෙස සැලකිය හැකිය. නාමපද මෙන් ම සන්ධි පද ද සිද්ධ කළ යුත්තේ බුද්ධවචනයට ගැලපෙන පරිදි ය.

ii. මණ්ඩූකගතික අධිකාරය :-

මැඩියා පැන පැන යන්නාක් මෙන් එක් සූත්‍රයකට සම්බන්ධ වී ඊළඟ සූත්‍ර කීපයකට ඇතින් ඇති සූත්‍රයකට සම්බන්ධ වේ නම් එය මණ්ඩූකගති ඇති අධිකාර සූත්‍රයකි.

iii. යථානුපුබ්බික අධිකාරය :-

පිළිවෙළින් සියලු සූත්‍රවලට සම්බන්ධ වේ නම් එය යථානුපුබ්බික අධිකාර සූත්‍රයක් ලෙස හැඳින්වේ. 'ජිනවචනයුත්තං හි' යන සූත්‍රය පිළිවෙළින් ඉදිරි සූත්‍රවලට සම්බන්ධ කළ යුතු සූත්‍රයක් බැවින් එය යථානුපුබ්බික අධිකාර සූත්‍රයක් ලෙස නම් කළ හැකි බව ඇතැම් අයගේ අදහස යි. එහෙත් එය සන්ධිවලටත් අදාළ බැවින් සීහගතික අධිකාරයක් ලෙස ගැනීම ම වඩා සුදුසු ය. කච්චායනයෙහි මීට අමතර ව පටිසෙධ සූත්‍ර ද දක්නට ලැබේ. කිසියම් සූත්‍රයකින් ප්‍රතිෂෙධ කාර්‍යයක් ඉගැන්වේ නම් එය පටිසෙධ සූත්‍රයකි. "ත තිමෙහි කතාකාරෙහි" යනු මීට නිදසුනකි. එම සූත්‍රයෙන් පැවසෙන්නේ ත ඉම ශබ්ද කෙරෙන් පරවූ ස්මා, ස්මිං යන ප්‍රත්‍යය දෙකට ම්හා, ම්හි යන ආදේශ දෙක නො වන බව යි. එ බැවින් එය ප්‍රතිෂෙධ සූත්‍රයක් ලෙස ගැනීම උචිත ය.

රචනා ශෛලිය

සූත්‍රය :- වාපරොඅසරූපා
වෘත්තිය :- සරම්හා අසරූපා පරො සරො ලොපං පප්පොති වා
උදහරණ :- චත්තාරො, මෙ භික්ඛවෙ
පයොග :- වාති කිං? පඤ්චින්ද්‍රියානි

ව්‍යාකරණ ඉගැන්වීමේ දී භාවිත කෙටි ක්‍රම

අපි ශබ්ද, ච ශබ්ද, වා ශබ්ද, නවා ශබ්ද, ඤචි ශබ්ද විභාෂා ශබ්ද හා අත්‍ථ ග්‍රහණ, ඒකවචන බහුවචන ග්‍රහණාදිය ද, කාර ග්‍රහණය ද සූත්‍ර දෙකට බෙදීම නම් වූ සූත්තවිභාගය ද සුදුසු පරිදි බුද්ධ වචනයට ගැලපෙන පරිදි යොදගෙන ඇත. සූත්‍ර රචනා කිරීමේ දී විශේෂයෙන් ආදි ස්වරය වෘද්ධි කිරීම සඳහා 'ණ' අනුබන්ධාක්ෂරය භාවිත කොට ඇත. නාම කාණ්ඩයේ දී ඇති සංඥා පහත දැක්වේ.

1. ග සංඥය - ආලපන සි විභක්තියට දී ඇති සංඥාවයි.
2. ස සංඥය - ස්ත්‍රීලිංග ආකාරාන්ත ශබ්දවල අන්තයට දී ඇති සංඥාවයි.

3. ඣ සංඥය - පුල්ලිංග නපුංසක ලිංග දෙකේ ඉවර්ණාන්ත ශබ්දවල අන්තයට දී ඇති සංඥාවයි.
4. ල සංඥය - පුල්ලිංග නපුංසක ලිංග දෙකේ උවර්ණාන්ත ශබ්දවල අන්තයට දී ඇති සංඥාවයි.
5. ප සංඥය - ස්ත්‍රීලිංගයේ ඉවර්ණාන්ත උවර්ණාන්ත ශබ්දවල අන්තයට දී ඇති සංඥාවයි.

මෙම සංඥා භාවිත කිරීම නිසා ව්‍යාකරණ කරුණු සරලව හා පහසුවෙන් ඉගැන්වීමට හැකි වේ. උදා :-"ඣලතො සස්ස නො වා" යන සූත්‍රයෙන් ඣ, ල යන සංඥාවන්ගෙන් පරවූ ස ප්‍රත්‍යයට විකල්පයෙන් "නො" ආදේශ වේ. එවිට අග්ගිනො, අග්ගිස්ස යන රූප සිද්ධ වේ. මෙවැනි කෙටිකුම භාවිතය වියරණ ඇදුරන් යොදා ගෙන ඇති උපක්‍රමයන් ලෙස හැඳින්විය හැකිය.

ප්‍රමාණය :-

කච්චායන ව්‍යාකරණයෙහි පරිච්ඡේද හඳුන්වනු ලබන්නේ "කප්ප" යනුවෙනි. ඒ අනුව පරිච්ඡේද අටකට බෙදා ඇත.

එනම් :
1. සන්ධි කප්ප
2. නාම කප්ප
3. කාරක කප්ප
4. සමාස කප්ප
5. තද්ධිත කප්ප
6. ආඛ්‍යාත කප්ප
7. කිබ්බිධාන කප්ප
8. උණාදි කප්ප යනුවෙනි.

ප්‍රයෝජනය :

කච්චායන ව්‍යාකරණය මැනවින් හැදෑරීමෙන් ත්‍රිපිටකය හා තදනුගත අට්ඨකථා ටීකා ඇතුළු ප්‍රකරණ සාහිත්‍යය අවබෝධ කර ගැනීමට මහත් අනුබලයක් සැලසේ. පද සිද්ධිය හා ව්‍යාකරණ දැනුම පිළිබඳ තියුණු මෙන්ම සම්පූර්ණ අවබෝධයක් ලබා ගත හැකි වේ.

මොග්ගල්ලායන ව්‍යාකරණ සම්ප්‍රදාය

මොග්ගල්ලායනය වනාහි ක්‍රි. ව. 1153 - 1186 අතර කාලයේ දී පොළොන්නරුවෙහි රජ කළ පළමු වන මහා පරාක්‍රමබාහු රජුගේ කාලයේ දී අනුරාධපුර ථූපාරාමයෙහි විසූ සුප්‍රකට පාලි ව්‍යාකරණඥයකු වූ මොග්ගල්ලායන නම් මහ තෙරුන් විසින් කච්චායනය අනුගමනය නො කොට සම්පාදනය කරණ ලද අංග සම්පූර්ණ වූ පාලි ව්‍යාකරණ ග්‍රන්ථයකි. 'මාගධ සද්දලක්ඛණ' යන අපර නාමයකින් ද හැඳින්වෙන මෙම ග්‍රන්ථය කච්චායන ව්‍යාකරණයට පසුව ලියන ලද්දක් බව නිසැකව ම කිව හැකි ය. මුලින් කළ කෘතියේ අඩුපාඩු පෙන්වා ඒවා සකස් කිරීම

පසුව සම්පාදිත කෘතියේ බොහෝ විට දක්නට ලැබේ. මතභේදයට තුඩු දෙන ඇතැම් කරුණු විවේචනයට භාජනය කර තිබේ. මොග්ගල්ලායන ව්‍යාකරණය ලියා ඇත්තේ පාණිනී ව්‍යාකරණය සහ 7 වන සියවසෙහි චන්ද්‍රගෝමීන් විසින් රචිත චාන්ද්‍ර ව්‍යාකරණය ඇසුරු කොට ගෙණ ය. මෙහි එන සූත්‍ර හා උදාහරණ බොහෝ සෙයින් සංස්කෘතයට නැඹුරු වේ. පොළොන්නරු යුගයේ විශේෂයෙන් සංස්කෘත භාෂාව දැඩි ලෙස පාලි සාහිත්‍යයට බලපෑ බව පැහැදිලි කරුණකි. සංස්කෘත පොත්පත් රාශියක් ම එකල ලක්දිව ව්‍යවහාරයට පත් වී ඇත. මීට පෙර සංස්කෘත කාව්‍යාදර්ශය අනුරාධපුර යුගයේ විසූ සිංහලයන් අතර භාවිත විය. ඡන්දස්, නිඝණ්ඩු, ජ්‍යොතිෂය වැනි ශාස්ත්‍ර ව්‍යවහාරයට පැමිණියේ පොළොන්නරු යුගයේ දීය. මේ ග්‍රන්ථ බෞද්ධයින් අතරට යොමු වන විට ඔවුන්ගේ ලේඛන කලාව ලෞකිකත්වයට සම්බන්ධ වන පරිදි පොත්පත් ලියැවිණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් පාලි ව්‍යාකරණ රාශියක සාහිත්‍යයක් බිහි විය. මෙයින් ඇති වූ පුනරුදය 12, 13 යන සියවස් වන විට ක්‍රියාත්මක වී ඇත. පොළොන්නරු යුගයෙහි විසූ බහුශ්‍රැත භික්ෂූන් සංස්කෘත සාහිත්‍යය කෙරෙහි දැක්වූ මහත් ගෞරවය නිසා සංස්කෘතයට බර පාලියක් බිහි වූ බව මේ යුගයේ පාලි සාහිත්‍යය කෘතිවලින් පෙනේ. එ නිසා එ කලට යෝග්‍ය පාලි ව්‍යාකරණ සංග්‍රහයක් අවශ්‍ය බව පෙනී ගිය හෙයින් මොග්ගල්ලායන තෙරුන් විසින් සංස්කෘතයට බර ව්‍යාකරණ කෘතියක් ලියන ලද බව මලලසේකර මහතා පවසයි. 7 මොග්ගල්ලායන හිමියෝ පාලියේ ස්වභාවයත් එහි නියම තත්ත්වයත් පිළිබඳ ව මනා දැනීමකින් යුක්ත ව සංස්කෘත භාෂාත්මක කරුණු ඉතා විස්තරාත්මක ව ඉදිරිපත් කළ බව දක්වන ගයිගර් මහතා ගේ මතය ද ඊට සමාන ය.

සද්දනීති ව්‍යාකරණ සම්ප්‍රදාය

කච්චායන සහ මොග්ගල්ලායන ව්‍යාකරණ සම්ප්‍රදාය දෙකට අමතර ව බුරුමයේ අරිමද්දන නුවර විසූ අග්ගමහාපණ්ඩිත අග්ගවංස නම් තෙරුන් විසින් ලියන ලද සද්දනීති නම් මහා පාලි ව්‍යාකරණ ග්‍රන්ථයක් ද, උත්තරජීව නම් තෙරුන් විසින් පොළොන්නරු යුගයෙහි දී ලංකාවට ගෙණවිත් ඇත. පාලි ව්‍යාකරණ ග්‍රන්ථ අතුරෙන් ඉන් විශාල ම ග්‍රන්ථය සද්දනීතිය යි. මෙහි ඇති සූත්‍ර මොග්ගල්ලායන ව්‍යාකරණයෙහි මෙන් සංස්කෘත භාෂාවට ළං වී නැත. බොහෝ සෙයින් කච්චායන සූත්‍රවලට ළං වී ගිය නමුත්, කච්චායනය අනුගමනය නො කොට අමුතුවෙන් ම කරණ ලද ව්‍යාකරණ කෘතියක් බව පොල්වත්තේ බුද්ධදත්ත නාහිමියෝ පවසති. මේ අනුව දැනට විද්‍යමාන පාලි ව්‍යාකරණ කෘති සියල්ලක් ම රචනා වී ඇත්තේ අට්ඨකථා රචනා වීමෙන් පසු කාලයක බව නිගමනය කළ හැකිය.

කච්චායන හා මොග්ගල්ලායන සම්ප්‍රදායයන්හි වෙනස්කම් :-

1. කච්චායනයෙහි ආරම්භක සූත්‍රයකින් දැක්වෙන "**අක්ඛරාපාදයො එකවත්තාලීසං**" යන්න පාලි භාෂා වේ ඇත්තේ අක්ෂර 41 ක් පමණක් බව දැක්වේ. අ, ආ, ඉ, ඊ, උ, ඌ, එ, ඔ යනුවෙන් ස්වර 8 ක් බව දක්වා ඇත්තේ සංස්කෘත රීතිය අනුගමනය කිරීම නිසා ය. සකු වියරණයෙහි "**එ ඒ ඔ ඖ සන්ධ්‍යක්ෂරාණි**" යනුවෙන් ද "**එෂාං හ්‍රස්වා න සන්ති**" යනුවෙන් ද ඉගැන්වෙන පරිදි 'එ ඔ' අක්ෂර දෙක නිතර ම දීඝ ව යෙදෙන බවත්, ඒවාට හ්‍රස්ව නැති බවත් පැවසේ. එහෙත් හ්‍රස්ව ලෙස ලිවීමක් මිස දීඝ වශයෙන් ලිවීමක් සංස්කෘතයෙහි නොමැත. කච්චායනය ද එම ඉගැන්වීම ගුරු කොට ගෙණ පාලියෙහි හ්‍රස්ව එ ඔ දෙකක් ඇති බවක් පිළිගෙන නැත. එහෙත් සංයෝගයකට මුලින් යෙදෙන **එ ඔ** දෙක හ්‍රස්ව වශයෙන් උච්චාරණය කළ යුතු බව කච්චායන සම්ප්‍රදයයෙහි පසුකාලීන ග්‍රන්ථයක් වන බාලාවතාරයෙහි ඉගැන්වේ. **එතථ. සෙය්‍යො. ඔට්ඨො. සොතඵ** වැනි තැන්වල හ්‍රස්ව ලෙස කියැවේ. **සංයොගතො පුබ්බෙ එ ඔ රස්සා ඉව උච්චන්තෙ කච්චි**. මේ මතය නො පිළිගන්නා මොග්ගල්ලායන ව්‍යාකරණය '**අ ආදයො තීතාලීසවණ්ණා**' යනුවෙන් පාලි වර්ණමාලාව අක්ෂර 43කින් සමන්විත බව දක්වා ඇත්තේ එ, ඒ, ඔ, ඕ යනුවෙන් හ්‍රස්ව හා දීඝ අකුරු ගැනීම නිසයි. පාලි වියරණය සකු වියරණයට ගැති නො වන්නක් බව තදින් පිළිගෙන තිබූ අදහසක් බව මෙයින් පෙනේ. **එකාරය** හා **ඔකාරය** සංයෝගයත් සමග එක ම වචනයකට අයිති නම් සංයෝගයකට මුලින් සිටි එම **එ ඔ** අකුරු දෙක හ්‍රස්ව වශයෙන් උච්චාරණය කළ යුතු බව මොග්ගල්ලායනය ද පිළිගනී. එසේ වුවත් **එ ඔ** අකුරු දෙක සංයෝගයකට මුලින් යෙදුනත් ඒවා වචන දෙකකට අයිති නම් දීඝ වශයෙන් ම උච්චාරණය වේ.

උදා :-මඤ්චෙ තවං නිඛනෙ වනෙ, පුත්තො ත්‍යාහං

මෙහි **එ ඔ** දෙක හ්‍රස්ව වශයෙන් උච්චාරණය නො වේ. වාග් විද්‍යාව අනුව වර්ණමාලාවේ අයන්න ආයන්න වුවා ද නැතහොත් ආයන්න අයන්න වුවා දැ' යි එක එල්ලේ ම කිව නොහැකි ය. එහෙත් කුඩා ළමයෙක් පළමුවෙන් එකවිට ම දීඝව උච්චාරණය කරණ නිසා පළමුවෙන් දීඝ ආයන්න ඇති වුවා යැ' යි ද, එහි ශබ්ද පරිණාමය අනුව අයන්න ඇති වූ බව ද සිතිය හැකිය. ඒ අනුව සලකන විට ඒ යන්නෙන් ශබ්ද පරිණාමය අනුව එයන්න ඇති වූ බව සැලකීම යුක්ති යුක්ත වේ. නූතන වාග්විද්‍යාවේ ශබ්දිම (Phoneme) සංකල්පය අනුව පාලි භාෂාවෙහි ලැබෙන ඒ, ඕ ශබ්දයන්ගේ හ්‍රස්ව-දීඝ ප්‍රභේද ද්වය වෙන් වෙන් ශබ්දිම ලෙස නොව එක් එක් ශබ්දිමයේ උප ශබ්ද(Allo-Phone) ලෙස සැලකේ. හැකි තරම් අරපිරිමැස්මෙන්

ශබ්ද සම්මත කිරීම මූලික ශබ්ද සම්මත කිරීමේ ප්‍රතිපත්තියයි. ස්වර දහයකින් කෙරෙන කාර්‍යය ස්වර අටකින් ඉටු කර ගැනීම ශබ්දිම ප්‍රතිපත්තියට ද එකඟ ය. එබැවින් කච්චායනයෙහි ස්වර අටක් ලෙස ගැනීම වඩාත් විදුහුරු ය.

2. සකු වියරණය අනුගමනය කළ කච්චායනය "වණ්ණ" යන යෙදුමෙන් අකුරු දෙකක් ගනී. ඉවණ්ණ යන්නෙන් ඉ, ඊ අකුරු දෙකම ගත යුතු ය.(වණ්ණග්ගහණෙ සවණ්ණග්ගහණං. කාරග්ගහණෙ කෙවලග්ගහණං) එහෙත් මොග්ගල්ලායනයෙහි 'වණ්ණ' යන යෙදුම භාවිත කොට ඇත්තේ අක්ෂර යන අර්ථයෙන් බව මෙහි දක්නට ලැබෙන විශේෂ ලක්ෂණයකි. අආදයො තිතාළිසවණ්ණා' අයන්න ආදී අකුරු 43කි. මෙහි දී "වණ්ණ" යන්න යෙදී ඇත්තේ අකුරු යන අර්ථය සඳහා ය.

3. කච්චායනයෙහි අනුබන්ධ නමින් දැක්වෙන්නේ ඉත් අකුරු ය. (අට්ඨිතධම්මා අනුබන්ධා) නො සිටින ස්වභාවය ඇත්තෝ අනුබන්ධ ය. සංස්කෘතයෙහි කාර්‍යායෙත් යන සූත්‍රයෙන් ද කිසියම් ප්‍රයෝජනයක් සඳහා උපයෝගී කර ගනු ලබන අක්ෂරවලට ඉත් යැයි ව්‍යවහාර කරණු ලැබේ. සංස්කෘතයෙහි මෙන් මොග්ගල්ලායනයෙහි ද ඉත් අකුරු යෙදීමේ දී මුල් තැනක් දී ඇත. කච්චායනයේ ප්‍රථමා ද්විතීයා බහුවචනයේ යො විභක්තීන්ට හා නි ආදේශයන්ට පිළිවෙළින් ආ එ ආදේශ වේ යනු එහි අදහස යි. මොග්ගල්ලායනයෙහි ඒ සඳහා දක්වා ඇත්තේ 'අතො යොනං ටාටෙ' යන සූත්‍රය යි. ආකාරාන්ත ශබ්දයන් කෙරෙන් පර වූ යො විභක්තීන්ට ආ එ ආදේශ වේ යනු එහි අර්ථය යි. මෙහි ආ එ දෙකට ටකාරයක් එකතු කර ඉත් අකුරක් වශයෙන් දක්වා ඇත්තේ යො කාරයේ ස්වරයට පමණක් නො ව යකාරය සහිත මුලු විභක්තියට ම ආ එ ආදේශ කළ යුතු බව දැන්වීම සඳහා යැ' යි වෘත්තියෙහි කියන ලදී. කච්චායනයෙහි දෙතුන් පළක පමණක් මේ ඉත් අකුරු භාවිත කොට ඇති බව පෙනේ. සංස්කෘත ව්‍යාකරණයෙහි ද මොග්ගල්ලායනයෙහි ද බොහෝ තැන්වල ඉත් අකුරු යොදා ගෙන ඇත.

4. කච්චායනයෙහි පරිභාෂා නම් වූ විශේෂ සූත්‍ර වෙන් කොට දක්වා නැත. ඒ ඒ තැන්වල ම පරිභාෂා සූත්‍ර දක්වා ඇත. එහෙත් මොග්ගල්ලායනයෙහි පරිභාෂා සූත්‍ර නමින් වෙන ම සූත්‍ර කිහිපයක් දක්වා තිබේ.

5. කච්චායනයෙහි පදමාලාවට පසු ව හෙවත් නාමකාණ්ඩයට අනතුරුව කාරක කාණ්ඩය දක්වා ඇත. එහෙත් මොග්ගල්ලායනයෙහි

කාරක කාණ්ඩය නාම කාණ්ඩයට මුලින් දක්වා තිබේ. කාරක කාණ්ඩයට පසුව පදසිද්ධිය හෙවත් නාම කාණ්ඩය දක්වා ඇත. කිසියම් භාෂාවක් පුහුණු කිරීමට නම් පළමුවෙන් වචන නොව වාක්‍ය කොටස් හෝ යෙදුම් ඉගෙන ගත යුතුයි. එ බැවින් මෙහි දී මොග්ගල්ලායනය අනුගමනය කර ඇති ක්‍රමය වඩාත් විද්‍යානුකූල වේ. කච්චායනයෙහි කිතක කාණ්ඩය අවසානයට දක්වා ඇතත් මොග්ගල්ලායනයේ අවසානයට දක්වා ඇත්තේ කාණ්ඩය යි.

6. නිග්ගහීතයට වන ආදේශ දැක්වීමේ දී කච්චායනයෙහි 'මදා සරේ' යන සූත්‍රයෙන් මකාර හා දකාර යනුවෙන් ආදේශ දෙකක් දක්වා ඇති නමුත්, මොග්ගල්ලායනයෙහි 'මයදා සරේ' යන සූත්‍රයෙන් ම, ය, ද යන ආදේශ තුනක් දක්වා තිබීම විශේෂ කරුණකි. නිදසුනක් වශයෙන් තං එව යන්නට යකාරය ආදේශ වීමෙන් තයෙව යන පදයක් සෑදෙන බව පෙන්වා දී ඇත.

7. කච්චායනයෙහි 'සිලාඝ හනු ඨා සප .... ආදි සූත්‍රයෙන් විහිත චතුර්ථී විභක්ති ප්‍රයෝගයන් මොග්ගල්ලායනයෙහි ෂෂ්ඨී විභක්ති ප්‍රයෝග ලෙස සලකා තිබේ.

8. මොග්ගල්ලායනයෙහි අරහ ශබ්දයේ ප්‍රථමා ඒකවචන අරහා යන රූපයක් ද, මහන්ත ශබ්දයේ මහා යන රූපයක් ද සද්ධා යන ශබ්දයේ තතියා ඒකවචනයේ සද්ධයා (සංස්කෘත : ශ්‍රද්ධයා යන රූපයක් ද, සභා, පරිසා යන ශබ්දවල සත්තමී ඒකවචනයෙහි සභතිං, පරිසදිං යන රූප ද දක්නට ලැබීම ද කච්චායන ව්‍යාකරණයට වඩා වෙනස් වන තැන් ය. කච්චායනයෙහි ඒ තැන්වල දක්නට ලැබෙන්නේ අරහං, මහං, සද්ධාය, සභායං, පරිසායං යන රූපයන් ය. එහෙත් සංස්කෘත පර්ෂදි > පරිසදිං යනුවෙන් අයථාසාදෘශ්‍ය හෙවත් වැරදි සාදෘශ්‍යරූප සභතිං, පරිසදිං යන රූප මොග්ගල්ලායනයෙහි දක්නට ලැබේ. මෙයින් පැහැදිලි වන්නේ සකුමුසු පාලියක් පොළොන්නරු යුගයෙහි බිහිවීම නිසා ඊට අදාළ පද සාධනය අවශ්‍ය වූ හෙයින් වෙත ම ව්‍යාකරණ සම්ප්‍රදායක් බිහිව ආ බවයි. මොග්ගල්ලායනයට පදසාධනය යනුවෙන් තවත් ව්‍යාකරණ ග්‍රන්ථයක් පසුකාලයෙහි රචනා වූවාක් මෙන් කච්චායනයට ද චොළිය බුද්ධප්පිය තෙරුන් විසින් රූපසිද්ධිය නමැති පදසාධන ව්‍යාකරණයක් රචනා කරණ ලදී. පොළොන්නරු යුගයෙහි දී ධම්මකීර්ති තෙරුන් විසින් "බාලාවතාරය" රචනා කර ඇත්තේ කච්චායනය තවදුරටත් සරළ අන්දමින් තේරුම් කර දීම සඳහා ය. මහාසද්දනීති, මුග්ධබෝධ, බාලාවබෝධිනී, සද්දසාරත්ථජාලිනී සබ්බගුණාකර ව්‍යාකරණ ආදි

ග්‍රන්ථ සියල්ල ම කච්චායනය ඇසුරෙන් බිහි වූ පාලි ව්‍යාකරණ ග්‍රන්ථ යි. පාලි ව්‍යාකරණ සාහිත්‍යය දියුණු වූයේ කච්චායන සම්ප්‍රදාය ඇසුරෙනි. මේ සම්ප්‍රදාය දෙකට ම වෙන වෙන ම සන්න ගැටපද ටීකා ලියවුණි. මෑතක දී බාලාවතාරයට ලියැවුණු **මකඳපොළ සන්නය** හා **ගඩලාදෙනි සන්නය**, **තත්වදීපිකා** වැනි සන්න ග්‍රන්ථ නිසා කච්චායන ව්‍යාකරණ සම්ප්‍රදාය ශ්‍රී ලංකාවෙහි පාලි ව්‍යාකරණ අධ්‍යයනයෙහි අතිශයින් ජනප්‍රිය විය. විද්‍යෝදය පරිවෙණාධිපතිව වැඩ විසූ වූ **අතිගරු හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමිපාණන් වහන්සේ** විසින් බාලාවතාරයට ලියන ලද **සුබොධිකා ටීකාව** විද්වතුන්ගේ පැසසුමට භාජන වූ කෘතියකි.

මෙම සංස්කරණය

ප්‍රාචීන භාෂෝපකාර සමාගම මගින් පැවැත්වෙන අවසාන විභාගයට නියමිත "**කච්චායන ව්‍යාකරණය**" මෙකල ඉතා දුර්ලභ පොතක් බැවින් ශිෂ්‍යයන්ට මහත් දුෂ්කරතාවන්ට මුහුණ පෑමට සිදු වී ඇත. එම දුෂ්කරතාවන් මග හරවා ලීම සඳහා සන්න සහිතව එම ග්‍රන්ථය මුද්‍රණය කරවීමට අවශ්‍ය වී ඇත.

කොළඹ මාලිගාකන්දේ විද්‍යෝදය පිරිවෙණේ උපප්‍රධානාචාර්‍යව වැඩ විසූ පූජ්‍ය හෙයියන්තුඩුවේ **සිරි දෙවමිත්තාභිධාන නායක මාහිමිපාණන්** වහන්සේ විසින් ක්‍රි. ව. 1904 වර්ෂයේ දී සම්පාදිතව, විද්‍යෝදය පරිවෙණාධිපති ත්‍රිපිටකවාගීශ්වරාචාර්‍ය, බෝධිසත්වගුණෝපෙත අතිගරු හික්කඩුවේ ශ්‍රී සුමංගලාභිධාන කොළඹ පළාතේ ප්‍රධාන සංඝනායක මාහිමිපාණන් වහන්සේ විසින් සමාදරයෙන් පිළිගන්නා ලද කච්චායන ව්‍යාකරණ සූත්‍ර සන්නය, පෙළ සහිතව සංස්කරණය කොට ශිෂ්‍යයන්ගේ ප්‍රයෝජනය සඳහා පළ කරවීමට විද්‍යෝදය පිරිවෙණේ ආදිශිෂ්‍ය සංගමය තීරණය කරණ ලදී.

මෙම සත්කාර්‍යයෙහි ලා ඉදිරිපත් වූ මරදාන, එස්. ගොඩගේ මහතාට ශාස්ත්‍රාභිලාෂීන්ගේ ප්‍රශංසාව හිමි විය යුතුය. මෙම ග්‍රන්ථය විකිණීමෙන් යම් ආර්ථික ලාභයක් වේ නම්, එය **"විද්‍යෝදය පිරිවෙණේ ආදිශිෂ්‍ය සංගමයේ අරමුදලට"** බැර කරණු ලැබේ.

ආදිශිෂ්‍ය සංගමය,
විද්‍යෝදය පිරිවෙණ,
හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමි මාවත,
මාලිගාකන්ද, කොළඹ 10.
1995. 04. 29.

මෙයට
සංස්කාරක,
ධර්ම ශාස්ත්‍රෝත්තතිකාමී,
වැගම් පියරතන හිමි
(ප්‍රධාන ලේකම්)

කච්චායනව්‍යාකරණං.

නමො තස්ස

භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස.

සෙට්ඨං තිලොකමහිතං අභිවන්දියාහං
බුද්ධඤ්ච ධම්මමමලං ගණමුත්තමඤ්ච,
සද්ධුස්ස තස්ස වචනත්ථවරං සුබොද්ධුං
වක්ඛාමි සුත්තහිතමෙත්ථ සුසක්කපපං.

සෙය්‍යං ජිනෙරිතනයෙන බුධා ලභන්ති
තඤ්චාපි තස්ස වචනත්ථසුබොධනෙන,
අත්ථඤ්ච අක්ඛරපදෙසු අමොහභාවා
සෙය්‍යත්ථිකො පදමතො විවිධං සුණෙය්‍ය.

—o—

අත්ථො අක්ඛරසඤ්ඤතො.—1—1

සබ්බවචනානමත්ථො අක්ඛරෙහෙව සඤ්ඤායතෙ.

අක්ඛරවිපත්තියං හි (සති) අත්ථස්ස ඤාණායතා හොති තස්මා අක්ඛර කොසල්ලං බහූපකාරං සුත්තනෙත්තෙසු.

අක්ඛරාපාදයො එකවත්තාලීසං—2—2

තෙ ච ඛො අක්ඛරාපි අකාරාදයො එකවත්තාලීසං සුත්තනෙත්තෙසු සොපකාරා-තං යථා-

අ ආ ඉ ඊ උ ඌ එ ඔ කඛ ගඝ ඞ චඡ ජඣ ඤ ටඨ ඩඪ ණ තථ දධ න පඵ බභ ම ය ර ල ව ස හ ළ අං ඉති—
අක්ඛරා නාම හොන්ති.

තෙන වුත්තො?—"අත්ථො අක්ඛරසඤ්ඤතො."

තත්ථොදනතා සරා අට්ඨ.—3—3

තත්ථ අක්ඛරෙසු අකාරාදිසු ඔදනතා අට්ඨඅක්ඛරා සරනාම හොන්ති-

තං යථා-අආ ඉඊ උඌ එ ඔ ඉති සරා නාම.
තෙන වුත්තෝ?—"සරා සරෙ ලොපං."

ලහුමත්තා තයො රස්සා.—4—4

තත්‍ර අට්ඨසු සරෙසු අකාරාදිසු ලහුමත්තා තයො සරා රස්සා නාම හොන්ති-තං යථා.

අ ඉ උ ඉති තයො රස්සා නාම.
තෙන වුත්තෝ?—"රස්සං."

අඤ්ඤෙ දීඝා.—5—5

තත්‍ර අට්ඨසු සරෙසු රස්සෙහි අඤ්ඤෙ පඤ්ච සරා දීඝා නාම හොන්ති—තං යථා.

ආ ඊ ඌ එ ඔ ඉති දීඝා නාම.
තෙන වුත්තෝ?—"දීඝං."

සෙසා ව්‍යඤ්ජනා.—6—8

යෙ පෙත්‍ථ අට්ඨ සරෙ සෙසා අක්ඛරා කකාරාදයො නිග්ගහීතාන්තා ව්‍යඤ්ජනා නාම හොන්ති-තං යථා.

ක ඛ ග ඝ ඞ च ඡ ජ ඣ ඤ ට ඨ ඩ ඪ ණ ත ථ ද ධ න ප ඵ බ භ ම ය ර ල ව ස හ ළ අං ඉති ව්‍යඤ්ජනා නාම.
තෙන වුත්තෝ?—"සරාපරානි ව්‍යඤ්ජනෙ"

වග්ගා පඤ්ච පඤ්ච සො මන්තා.—7—9

තෙසං ඛො ව්‍යඤ්ජනානං කකාරාදයො මකාරන්තා පඤ්ච පඤ්චසො අක්ඛරවන්තො වග්ගා නාම හොන්ති-තං යථා.

ක ඛ ග ඝ ඞ-च ඡ ජ ඣ ඤ-ට ඨ ඩ ඪ ණ-ත ථ ද ධ න-ප ඵ බ භ ම—ඉති වග්ගා නාම.
තෙන වුත්තෝ? "වග්ගන්තං වා වග්ගෙ."

අං ඉති නිග්ගහීතං.—8-10

අං ඉති නිග්ගහීතං නාම හොති.
තෙන වුත්තෝ?—"අං ව්‍යඤ්ජනෙ නිග්ගහීතං."

පරසමඤ්ඤා පයොගෙ.—9-11

යා ච පන සක්කතගන්ථෙසු සමඤ්ඤා ඝොසාති වා අඝොසාති වා තා පයොගෙ සති එත්‍ථාපි යුජ්ජන්තෙ.

තත්‍ර ඝොසවන්තො නාම—ග ඝ ඞ ජ ඣ ඤ ඩ ඪ ණ ද ධ න බ භ ම ය ර ළ ව හ ළ ඉති ඝොසා නාම.

අඝොසා නාම-ක ඛ, च ඡ, ට ඨ, ත ථ, ප ඵ, ස ඉති අඝොසා නාම.
තෙන වුත්තෝ?—"වග්ගෙ ඝොසාඝොසානං තතිය පඨමා.

පුබ්බමධොඝිතමසසරං සරෙන වියොජයෙ.—10—12

තත්ථ සන්ධිං කත්තුකාමො පුබ්බබ්‍යඤ්ජනං අධොඝිතං අසසරං කත්වා සරඤ්ච උපරි කත්වා සරෙන වියොජයෙ-තත්‍රායමාදි.

නයෙ පරං යුත්තෙ.—11—14

අසසරං ඛො බ්‍යඤ්ජනං අධො ඝිතං පරක්ඛරං නයෙ යුත්තෙ. තත්‍රාභිරතිම්ඉච්ඡෙය්‍ය.

යුත්තෙතති කසමා?—අක්ඛොඝිමි මං අවධි මං අජිනි මං ඇහාරි මෙ, එත්ථ පන යුත්තං න හොති.

ඉති සන්ධිකප්පෙ පඨමො කණ්ඩො.

සරා සරෙ ලොපං.—12—13

සරා ඛො සබ්බෙපි සරෙ පරෙ ලොපං පප්පොන්ති.

යස්සිත්‍රියානි සමථං ගතානි, නොහෙතං භත්තෙන, සමෙතායස්ස සඤ්ඤත.

වා පරො අසරූපා.—13—15

සරමහා අසරූපා පරො සරො ලොපං පප්පොති වා.

චත්තාරොමෙ භික්ඛවෙ ධම්මා, කිත්තිමාව සමණියො.

වා ති කසමා?—පඤ්චින්‍රියානි, තස්සසුධම්මා ජහිතා භවන්ති.

ඛවාසවණ්ණං ලුත්තෙ.—14—16

සරො ඛො පරො පුබ්බසරෙ ලුත්තෙ ඛවි අසවණ්ණං පප්පොති.

සඛ්‍යං නොපෙති වෙදගු, බන්ධුසෙසව සමාගමො.

ඛවීති කසමා?-යස්සිත්‍රියානි, තදුපමං ධම්මවරං අදෙසයි.

දීඝං.—15—17

සරො ඛො පරො පුබ්බසරෙ ලුත්තෙ ඛවි දීඝං පප්පොති.

සදධිධ විත්තං පුරිසස්ස සෙට්ඨං, අනාගාරෙහි චූභයං.

ඛවීති කසමා?—පඤ්චහුපාලි අඤ්ඤහි සමනතාගතො, සාධු සුසුදං කිඤ්චි.

පුබ්බො ච.—16—18

පුබ්බො ච සරො පරසරලොපෙ කතෙ ඛවි දීඝං පප්පොති.

කිංසුධ විත්තං පුරිසස්ස සෙට්ඨං, සාධුනි පටිසුණිතා.
ක්වචීති කස්මා?—ඉතිස්ස මුහුත්තමපි.

යමෙදන්තස්සාදෙසො.—17—19

එකාරස්ස අන්තභූතස්ස සරෙ පරෙ ක්වචි යකාරාදෙසො හොති.

අධිගතො ඛො ම්‍යායං ධම්මො, ත්‍යාහං එවං වදෙය්‍යං, ත්‍යාස්ස පතීණා හොන්ති.

ක්වචීති කස්මා?—තෙනාගතා, ඉති නෙත්ථ.

වමොදූදන්තානං.—18—20

ඔකාරුකාරාන්තානං අන්තභූතානං සරෙ පරෙ ක්වචි වකාරාදෙසො හොති.

අට්ඨවස්ස, සවස්ස හොති, බවහාබාධො, වට්ටෙත්ථ විහිතං නිච්චං, චඛ්වාපාථමාගච්ඡන්ති.

ක්වචීති කස්මා?—චත්තාරොමෙ භික්ඛවෙ ධම්මා, කින්නුමාව සමණියො.

සබ්බා චන්ති.—19—22

සබ්බා නි ඉච්චෙසො නිසද්දො ව්‍යඤ්ජනො සරෙ පරෙ ක්වචි වකාරං පපෙජාති.

ඉච්චෙතං කුසලං, ඉච්චස්ස වචනීයං, පච්චුත්තරිතා-පච්චාහරති.
ක්වචීති කස්මා?—ඉතිස්ස මුහුත්තමපි.

දෙ ධස්ස ච.—20—27

ධ ඉච්චෙතස්ස සරෙ පරෙ ක්වචි දකාරාදෙසො හොති.

එකම්දහං භික්ඛවෙ සමයං.

ක්වචීති කස්මා?—ඉධෙව මරණං භවිස්සති.

ච සද්දග්ගහණෙන ධකාරස්ස කකාරාදෙසො හොති.

සාහු දස්සනමරියානං.

සුත්තාවිභාගෙන බහුධාපි සියා.

තො දස්ස-ස්ථා, සුගතො—ටො තස්ස—ස්ථා, දුක්ඛවං—ඛො තස්ස—ස්ථා, ගන්ධබ්බා—ත්‍රො තස්ස—ස්ථා, අත්‍රජෙ—කො ගස්ස—ස්ථා, කුලූපගෙ—ළො රස්ස—ස්ථා, මහාසාළ්‍ලා—ජො යස්ස-ස්ථා, ගවජෙ—බො වස්ස-ස්ථා, කුබ්බතො—කො යස්ස-ස්ථා, සකො—යො ජස්ස-ස්ථා, නීයං සුත්තං—කො තස්ස—ස්ථා, නියකො—චො තස්ස-ස්ථා, භවෙවා—ථො පස්ස—ස්ථා, නිපජ්ජති—බො පස්ස—ස්ථා, නිබ්බත්ති—ඛො කස්ස-ස්ථා, නික්ඛමති—ඉච්චෙවමාදයො.

ඉවණ්ණා යං නවා.—21—21

පුබ්බො ඉවණ්ණා සරෙ පරෙ යකාරං පපොති නවා.

පරිසඤ්ඤාරවුත්‍යසස, සබ්බාවිත්‍යනුභූයතෙ.

නවාති කසමා?—පඤ්චහඞ්ගෙහි සමන්නාගතො, මුත්තචාගී අනුද්ධතො.

එවාදිසස රි පුබ්බො ච රසෙසා.—22—28

සරමහා පරසස එවසස එකාරසස ආදිසස රිකාරො හොති පුබ්බො ච සරො රසෙසා හොති නවා.

යථරිව වසුධාතලඤ්ච සබ්බං, තථරිව ගුණවා සුපූජනීයො.

නවාති කසමා?—යථා එව, තථා එව.

ඉති සන්ධිකපෙප දුතියො කණ්ඩො.

සරා පකති ඛ්‍යඤ්ජනෙ.—23—36

සරා ඛො ඛ්‍යඤ්ජනෙ පරෙ පකති රූපානි හොන්ති.

මනොපුබ්බඞ්ගමා ධම්මා, පමාදෙ මච්චුනො පදං, තිණ්ණො පාරගතො අහු.

සරෙ ක්වචි.—24—35

සරා ඛො සරෙ පරෙ ක්වචි පකතිරූපානි හොන්ති.

කො ඉමං පඨවිං විජෙස්සති.

ක්වචීති කසමා?—අපපස්සුතායං පුරිසො.

දීඝං.—25—37

සරා ඛො ඛ්‍යඤ්ජනෙ පරෙ ක්වචි දීඝං පපොන්ති.

සමමා ධම්මං විපස්සතො, එවං ගාමෙ මුනී චරෙ, ඛන්ති පරමං තපො තිතික්ඛා.

ක්වචීති කසමා?-ඉධ මොදති, පෙච්ච මොදති, පතිලීයති, පතිහඤ්ඤති.

රස්සං.—26—38

සරා ඛො ඛ්‍යඤ්ජනෙ පරෙ ක්වචි රස්සං පපොන්ති.

භොවාදි නාම සො හොති, යථා භාවි ගුණෙන සො.

ක්වචීති කසමා?-සමමාසමාධි, සාඛ්‍යාතී ඡන්දසො මුඛං, උපනීයති ජීවිතමප්පමායු.

ලොපඤ්ච තත්‍රාකාරො.—27—39

ඤරා ඛො ව්‍යඤ්ජනෙ පරෙ ක්වචි ලොපං පපොජ්ජති තත්‍ර ච ලොපෙ සති අකාරාගමො හොති.

සසිලවා, සපඤ්ඤවා, එසධමෙමා සනන්තනො, සවෙ කාසාවමරහති, සමානකාමො පි භවෙය්‍ය, සවෙ මුනී ජාතිභයං අදසසී.

කථිති කසමා?-සො මුනි, එසො ධමෙමා පදිසසති, න සො කාසාවමරහති.

පරවෙභාවො ඨානෙ.—28—40

සරම්හා පරස්ස ව්‍යඤ්ජනස්ස වෙභාවො හොති ඨානෙ.

ඉධපපමාදෙ පුරිසස්ස ජනතුනො, පබබජ්ජං කිත්තයිස්සාමි, චාතුද්දස පඤ්චදසී, අභික්කන්තතරො ච පණීතතරො ච.

ඨානෙති කසමා?-ඉධ මොදති පෙච්ච මොදති.

වග්ගෙ ඝොසාඝොසානං තතියපඨමා—29—42

වග්ගෙ ඛො පුබ්බස්ස ව්‍යඤ්ජනස්ස ඝොසාඝොසභූතානං සරම්හා යථා සඛ්‍යං තතියපඨමක්ඛරා වෙභාවං ගච්ඡන්ති ඨානෙ.

එසො වත්‍රාඛාතඵලො, යත්‍රට්ඨිතං නපපසහෙය්‍ය මච්චු, සෙලෙ යථා සබ්බතාවුත්‍රිඨිතො, චත්‍රාරිට්ඨානානි නරො පමත්තො.

ඨානෙති කසමා?--ඉධ වෙතසො දළ්හං ගණ්හාති ඨාමසා.

ඉති සන්ධිකපෙ තතියො කණ්ඩො.

අං ව්‍යඤ්ජනෙ නිග්ගහීතං—30—58

නිග්ගහීතං ඛො ව්‍යඤ්ජනෙ පරෙ අං ඉති හොති.

එවං මුනෙො තං සාධුනි පරිසසුණාතු.

වග්ගන්තං වා වග්ගෙ.—31—49

වග්ගගතෙ ව්‍යඤ්ජනෙ පරෙ නිග්ගහීතං ඛො වග්ගන්තං වා පපොජ්ජති.

තත්‍රාභිඛ්‍යාතං, ධම්මසඤ්ඤරෙ සුචරිතං න තං දුච්චරිතසඤ්ඤරෙ, චිරමප්‍ප භාසිං පුරිසං, සන්තානස්ස මනං හොති, තඤ්ඤාරුණිකා, එවඤ්ඤා සිකඛිතබ්බං.

නිග්ගහීතෙන නිග්ගහීතං ඛො ලකාරාදෙසො හොති-පුල්ලිඞ්ගං.

කාති කසමා?—න තං කම්මං කතං සාධු.

එකෙකදුකං.—32—50

එකාරෙ හකාරෙ ච පරෙ නිග්ගහීතං ඛො දුකාරං පපොජති වා. පච්චත්තකෙදුව පරිනිබ්බායිස්සාමි, තදෙදුවෙත්ථ පටිපුච්ඡිස්සාමි,

එවඤ්හි වො භික්ඛවෙ සික්ඛිතබ්බං, තඤ්හි තස්ස මුසා හොති,.

වාති කසමා?—එවමෙතං අභිඤ්ඤාය, එවං හොති සුභාසිතං.

ස යෙ ච.—33—51

නිග්ගහීතං ඛො යකාරෙ පරෙ සහ යකාරෙන දුකාරං පපොජති වා.

සඤ්ඤොගො, සඤ්ඤත්තං.

වාති කසමා?—සංයොගො, සංයුත්තං.

මද සරෙ.—34—52

නිග්ගහීතස්ස ඛො සරෙ පරෙ මකාරදකාරාදෙසා හොන්ති වා

තමහං බ්‍රූමි බ්‍රාහ්මණං, එතදවොච සත්ථා.

වාති කසමා?—අක්ඛෙකාවජ්ජි මං අවධි මං අජිනි මං අහාසි මෙ.

යවමදනතරළා චාගමා.—35—34

සරෙ පරෙ යකාරො වකාරො මකාරො දකාරො නකාරො තකාරො රකාරො ළකාරො ඉමෙ ආගමා හොන්ති වා.

නත්‍රිමස්ස විජ්ජා, යථාසිදං විත්තං, මිගී භන්තා වුදිත්ථඤ්ච, සිත්තා තෙ ලහුමෙස්සන්ති, අසිත්තා තෙ ගරුමෙස්සන්ති, අසෙසං හත්ථෙ කසාම්ව, සම්මදඤ්ඤු විමුත්තානං, මනසාදඤ්ඤු විමුත්තානං, අත්තාදත්ථමභිඤ්ඤාය, විරංනායති, ඉතොනායති, යස්මාතිහ භික්ඛවෙ, තස්මාතිහ භික්ඛවෙ. අජ්ජතග්ගෙ පාණුපෙතං, සබ්බ්‍රෙව සමාසෙථ, ආරග්ගෙරිව සාසපො, සාසපොරිව ආරග්ගො, ඡළභිඤ්ඤු, ඡළායතනං.

වාති කසමා?-එවං මහිද්ධියා එසා, අක්ඛෙකාවජ්ජි මං අවධි මං අජිනි මං අහාසි මෙ, අජෙය්‍යො අනුගාමියො.

එසද්දග්ගහණෙන ඉධෙව මකාරස්ස පකාරො හොති, යථා-විරජ්ජ වාසිං පුරිසං.

කකාරස්ස දකාරො හොති-යථා-සදත්ථපසුතො සියා, දකාරස්ස ච තකාරො හොති—යථා-සුගතො.

ඤවි ඔ ඛ්‍යඤ්ජනෙ.—36—47

ඛ්‍යඤ්ජනෙ පරෙ ඤවි ඔකාරාගමො හොති.

අතිපපගො ඛො තාව සාවත්ථියං පිණ්ඩාය චරිතුං, පරොසතස්සං භික්ඛූසතං.

ඛවීති කසමා?—එථ පස්සථිමං ලොකං, අඛිභූතො අයං ලොකො.

නිග්ගහීතං ච.—37—57

නිග්ගහීතං ච ආගමො හොති සරෙ වා ව්‍යඤ්ජනෙ වා පරෙ ඛවි.

වඤ්ඡුං උදපාදි, අවංසිරො, යාවංචිදං භික්ඛවේ, පුරිමංජාති, අණ්ඩං ලුලායි සබ්බසො, මනොපුබ්බංගමා ධම්මා.

